**මුතූර් ප්‍රාදේශීය සභාව**

**-----------------------------**

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**

**----------------------------**

**1. මූල්‍ය ප්‍රකාශ**

**--------------**

**1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම**

**-------------------------------**

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2015 මාර්තු 25 දින ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2014 මැයි 13 දින ඉදිරිපත් කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 20 දින සභාවේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කරන ලදි.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

**--------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට මුතූර් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම්**

**---------------------------------------**

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වීම.**

**-----------------------------------------------------------------**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 අනුව මූල්‍ය ප්‍රකාශයන් සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි.

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**

**-----------------------**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) නව බස්නැවතුම් පොළෙහි කඩකාමර 38 ක් සහ පොදු වෙළඳපොළෙහි කඩකාමර 53 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා අයවිය යුතු වූ පිළිවෙලින් රු.228,000 ක් සහ රු.316,195 ක් කුලී ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේදී රු.400,007 ක පිරිවැයකට මිලදීගත් පුස්තකාල පොත්, එම පුස්තකාල පොත් ගිණුමට ගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා රු.17,615 ක් වූ විගණන ගාස්තු සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**-----------------------------------**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 1984 සිට 2014 වර්ෂය දක්වා හිඟව තිබූ එකතුව රු.11,479,985 ක් වූ ආදායම් අයකර ගැනීමට කටයුතු නොකොට දිගින් දිගට මූල්‍ය ප්‍රකාශයන්හි දක්වා තිබුණි.

(ආ) සේවකයන් 32 දෙනෙකුට ලබාදෙන ලදුව හිඟ හිටි එකතුව රු.244,644 ක් වූ කාර්ය මණ්ඩල ණය අයකර ගැනීමට කටයුතු නොකොට 2007 වර්ෂයේ සිට දිගින් දිගට මූල්‍ය ප්‍රකාශයන්හි දක්වා තිබුණි.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

පහත සඳහන් එක් එක් ගිණුම් විෂයය ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ඉඩම් සහ ගොඩනැගිලි | 37,868,086 | හිමිකම් ඔප්පු |
| පිරියත් සහ යන්ත්‍ර සූත්‍ර | 963,531 | ස්ථාවර වත්කම් ලේඛනය සහ සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| ලීබඩු | 28,916,570 | |
| සාප්පු සංකීර්ණය | 4,967,426 | |
| මෝටර් වාහන | 1,029,520 | |
| කලින් ගෙවීම් | 10,725,435 | අත්තිකාරම් ලේඛනය |
| හිඟ වරිපනම් | 4,576,098 | වරිපනම් ලේඛනය |
| ටෙන්ඩර් තැන්පතු | 1,625,000 | ටෙන්ඩර් තැන්පතු ලේඛනය |

### 1.3.5 නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීමේ අවස්ථා විශ්ලේෂණය කොට පහත දැක්වේ.

| නීති, රීති ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (i) වගන්තිය | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවතින නිශ්චල දේපල හඳුනාගෙන වටිනාකම තක්සේරු කර වරිපනම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති - 1988 | |
| (i) I පරිච්ඡේදයේ 5(XII) වගන්තිය | මුදල්, ගබඩා සහ චෙක්පත් අත්සන් කිරීම පරිපාලනමය වශයෙන් නිලධාරීන් තිදෙනෙකුට පවරා තිබුණු නමුත් ඔවුන්ගෙන් ආරක්ෂක ඇප ලබාගෙන නොතිබුණි. |
| (ii) III පරිච්ඡේදයේ 81 වගන්තිය | එක් එක් කාර්තුව අවසානයේදී ඉඩම් අයිතිය වෙනස්වීම් පිළිබඳ මුද්දර ගාස්තු ආපසු ගෙවන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන්ද, වෙනත් ගනුදෙනු පිළිබඳ බදු ආපසු ගෙවන ලෙස මහා භාණ්ඩාගාරයේ අධ්‍යක්ෂවරයාගෙන්ද, දඩ මුදල් ආපසු ගෙවන ලෙස උසාවියේ රෙජිස්ට්‍රාර්වරයාගෙන්ද ඉල්ලීම් කර නොතිබුණි. |

| | |
|---|---|
| (iii) X පරිච්ඡේදයේ 193 වගන්තිය | තථ්‍ය ආදායම සහ වියදම අයවැය ලේඛනය සමඟ සසඳා විචලනයන් සඳහා හේතු පැහැදිලි කිරීම් ප්‍රකාශයක් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |

(ඈ) නැගෙනහිර පළාත් මූල්‍ය රීති

| | |
|---|---|
| මූල්‍ය රීති 237 | වර්ෂ දෙකකට පෙර සභාව විසින් රු.20,667 ක වටිනාකමට නිකුත් කළ එහෙත් ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්පත් 11 ක් පිළිබඳව කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන් අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම් අතිරික්තය රු.22,182,927 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.14,000,313 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.8,182,614 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 2.2 ආදායම් කළමනාකරණය

#### 2.2.1 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

සභාව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය තුළ ඇස්තමේන්තුගත ආදායම් සහ තථ්‍ය ආදායම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | 2014 දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වරිපනම් | 791,500 | 781,500 | 4,649,819 |
| කුලී | 7,315,215 | 7,399,730 | 6,381,988 |
| සේවා සඳහා ගාස්තු | 9,566,000 | 7,903,305 | 10,054 |
| වෙනත් ආදායම් | 34,025,193 | 26,538,436 | 331,940 |
| | 51,697,908 | 42,622,971 | 11,373,801 |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් සභාවට පරිත්‍යාග කරන ලද වාහන 13 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට වර්ෂ 11 ක කාලයක් තිස්සේ කටයුතු කර නොතිබුණි.

(ආ) පුර නැගුම ව්‍යාපෘතිය යටතේ රු.22,820,738 ක පිරිවැයකට ඉදිකරන ලද වෙළඳපොල කඩකාමර 40 ක් 2012 වර්ෂයේදී භාරදී තිබුණ අතර එයින් කඩකාමර 13 ක් කිසිදු කුලියක් අය නොකොට ලබාදී තිබුණු අතර ඉතිරි කඩකාමර 27 උපයෝජනය නොකොට 2014 දෙසැම්බර් 18 දින වනවිටත් නිෂ්ක්‍රීයව තිබුණි.

(ඇ) 1988 විවෘත කරන ලද ඉතිරි කිරීමේ ගිණුමක ක වූ රු.400,642 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුල රු.16,965 ක් වූ පොලියක් ලැබී තිබුණි. මෙම ශේෂය එක් වර්ෂයක් සඳහා වූ ස්ථාවර තැන්පතුවකට මාරු කළේ නම් සියයට 09 ක පොලී අනුපාතයක් යටතේ රු.36,057 ක ආදායමක් උපයාගත හැකිව තිබුණි. එමනිසා සමාලෝචිත වර්ෂය තුළ පොලී ආදායම් රු.19,092 ක් සභාවට අහිමි වී තිබුණි.

(ඈ) පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාගේ කාර්යාලයට 2010 සහ 2011 වර්ෂ වෙනුවෙන් ගාස්තු වශයෙන් රු.48,000 ක් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි.

(ඉ) සේවකයන්ගෙන් සහ වැන්දඹු සහ අනත්දරු අරමුදලෙන් 1986 වර්ෂයේදී අයකරගන්නා ලද සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් වූ රු.355,405 ක් අදාල අරමුදල්වලට ප්‍රේෂණය නොකොට තැන්පතු ගිණුමෙහි රඳවා තබාගෙන පසුව ආදායමට මාරුකර තිබුණි.

(ඊ) සභාවට අයත් සාප්පු සංකීර්ණයේ වූ කඩකාමර 53 ක් එම කඩකාමර කුලියට ගත් පාර්ශවයන් විසින් වර්ෂ 15 ක් තිස්සේ අඛණ්ඩව භාවිත කර තිබුණු නමුත් ප්‍රාදේශීය සභා පනතේ 173 වගන්තිය ප්‍රකාරව ඔවුන් සමඟ කිසිදු ගිවිසුමකට එළඹී නොතිබුණි. එබැවින් වර්තමානයේ පවත්නා කුලී ගණන් පිලිබඳ නොසලකා වර්ෂ 15 කට පෙර නියම කරන ලද රු.1,800 සිට රු.3,000 ක් දක්වා වූ අඩු කුලියක් වාර්ෂිකව අය කර තිබුණි. එබැවින් සභාවට දල වශයෙන් රු.1,621,800 ක පමණ ආදායමක් අහිමි වී තිබුණි. තවද, සභාවෙන් මෙම කඩකාමර කුලියට ගත් පුද්ගලයන් එම කඩකාමර රු.3,000 සිට රු.5,000 දක්වා වූ පරාසයක කුලියකට අතුරු බදු දී තිබුණු බව එම කඩකාමර වර්තමානයේ භාවිත කරන පුද්ගලයන්ගෙන් ලබාගත් ලිඛිත ප්‍රකාශනයන්ගෙන් විගණනයට සනාථ විය.

4. කොන්ත්‍රාත් පරිපාලනය

(අ) නව බස් නැවතුම්පොළෙහි සාප්පු සංකීර්ණයක් ඉදිකිරීම.

පුරනැගුම ව්‍යාපෘතිය යටතේ කඩකාමර 40 කින් යුතු සාප්පු සංකීර්ණයක් ඉදිකිරීම සඳහා 2012 ජනවාරි 21 දින මුතූර් ප්‍රාදේශීය සභාව වටිනාකම රු.22,820,738 ක් වූ ගිවිසුමකට එළඹ තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) මෙම ඉදිකිරීම් කටයුතු නිමකොට කොන්ත්‍රාත්කරු විසින් 2012 ඔක්තෝබර් 30 දින ගොඩනැගිල්ල සභාව වෙත භාරදී තිබුණු නමුත්, කඩකාමර 04 ක බිත්ති හතරෙහි අඩි 12 ක් දිගට ඉරිතැලීම් සහ අනිකුත් කඩකාමර බිත්තිවල සුළු ඉරිතැලීම් පැවති බවත් 2014 දෙසැම්බර් 18 දින සිදුකළ විගණන පරීක්ෂණයේදී නිරීක්ෂණය විය. තවද, කඩකාමරවල ඉදිරිපස කොන්ක්‍රීට් කර නොතිබුණු බැවින් වැසි දිනවල වතුර ගලා නොබැසීම් සහ ජල කාන්දුවීම් දක්නට ලැබුණි. මෙම අඩුපාඩු සියල්ල සැලකිල්ලට නොගෙන කොන්ත්‍රාත්කරුට මෙම ඉදිකිරීමේ ඇස්තමේන්තුගත මුදල් ප්‍රමාණයම ගෙවා තිබුණු අතර රඳවුම් මුදල්ද ආපසු ගෙවා තිබුණි.

(ii) මෙම කරුණ 2013 වර්ෂය සඳහා වූ මාගේ වාර්තාවෙන්ද පෙන්වා දෙන ලද නමුත්, මේ වන විටත් ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. තවද, විශාල මුදලක් වැයකොට ඉදිකළ මෙම ගොඩනැගිල්ල මේ වනතෙක් අපේක්ෂිත කාර්යය සඳහා යොදවා ගෙන නොතිබුණි.

(ආ) මුතුර් නව බස් නැවතුම්පොළෙහි වෙළඳපොල ගොඩනැගිල්ල

පුරනැගුම ව්‍යාපෘතිය යටතේ වෙළඳපොල ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා මුතුර් ප්‍රාදේශීය සභාව 2013 අගොස්තු 27 දින රු.23,366,108 ක් වූ මුදලකට ගිවිසුමකට එළඹ තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2013 දෙසැම්බර් 26 ට පෙර කොන්ත්‍රාත් කටයුතු නිමකළ යුතු වුවද, මෙම කටයුතු නිමකරන ලද්දේ 2014 පෙබරවාරි 25 දිනදීය.

(ii) ගොඩනැගිල්ලෙහි මීටර් 350 ක් දිග තාප්පයක් ඉදිකර තිබුණු අතර ඒ සඳහා රු.269,850 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද, 2015 ජුනි 24 දින සිදුකළ විගණන පරීක්ෂණයේදී මෙම තාප්පය මුළුමනින්ම කැඩී බිඳී තිබූ බව නිරීක්ෂණය වූ අතර එය මේ දක්වා අළුත්වැඩියා කර නොතිබුණි.

(iii) සිල්ලර වෙළඳාම සඳහා ඉදිකරන ලද මෙම ගොඩනැගිල්ල 2014 පෙබරවාරි 25 දින නිමකොට සභාවට භාරදී තිබුණු නමුත්, මෙම ගොඩනැගිල්ල අපේක්ෂිත කාර්යය සඳහා යොදවාගෙන නොතිබුණි. මෙම ගොඩනැගිල්ල සිල්ලර වෙළඳාම සඳහා ලබා නොදී මාර්ගය දෙපස සිල්ලර වෙළඳාම් කටයුතු කිරීමට ප්‍රාදේශීය සභාව අනුමැතිය ලබාදී තිබුණු අතර 2015 වර්ෂය සඳහා රු.219,510 ක බදු කුලියක් නියම කර තිබුණි. මේ වනවිට ගොඩනැගිල්ල නිෂ්ක්‍රීයව තිබුණු අතර මාර්ගයේ ප්‍රවාහන කටයුතුද අවහිර වී තිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

2014 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත කාර්ය මණ්ඩලය සහ තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| කාර්ය මණ්ඩල වර්ගය | අනුමත කාර්ය මණ්ඩලය | තථ්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| විධායක | 01 | - | 01 |
| සහායක | 29 | 26 | 03 |
| සුළු සේවක | 76 | 66 | 10 |

ලේකම් තනතුර 2011 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවතුණ අතර ස්ථිර පදනම මත පුද්ගලයෙකු පත් නොකොට වැඩබැලීමේ පදනම මත කාර්ය මණ්ඩලය පත්කර තිබුණි.

4. පද්ධති හා පාලන
--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් කළමනාකරණය
(ඇ) ස්ථාවර වත්කම් පාලනය
(ඈ) අයවැය ලේඛනමය පාලනය